MILCO
දේශයේ අභිමානය

# වාර්ෂික වාර්තාව

## 2010-2011



### අපේ දැක්ම

ශ්‍රී ලංකාව තුල විශිෂ්ඨතම පෝෂණීය ආහාරපාන සමාගම ලෙස ස්ථාපිත කිරීම.

### අපේ මෙහෙවර

ශ්‍රී ලංකාව නැවුම් කිරි වලින් ස්වයංපෝෂිත කර මව් කිරෙන් පසු විවිධ වර්ගයේ පෝෂණීය ආහාර සෑම ජනකොටසකටම හා සෑම වයස් ඛාණ්ඩයකටම ලබාදීම.

# පටුන


| | |
|---|---|
| ආයතනික විස්තර | 1 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 2 - 3 |
| නියෝජ්‍ය සභාපතිතුමාගේ පණිවිඩය | 4 |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ පණිවිඩය | 5 |
| කොළඹ කම්හල් කළමණාකරුගේ පණිවිඩය | 6 |
| කම්හල් කළමණාකරුගේ පණිවිඩය - අඹේවෙල | 7 |
| කම්හල් කළමණාකරුගේ පණිවිඩය - දිගන | 8 |
| කම්හල් කළමණාකරුගේ පණිවිඩය - පොලොන්නරුව | 9 |
| මුදල් පාලකගේ සමාලෝචනය | 10 - 12 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව | 13 - 14 |
| ආයතනික පාලනය | 15 |
| විගණන කමිටු වාර්තාව | 16 |
| විගණවරුන්ගේ වාර්තාව | 17 |
| ආදායම් ප්‍රකාශය | 18 |
| ශේෂ පත්‍රය | 19 |
| හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 20 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 21 |
| මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් | 22 - 43 |
| මූල්‍ය විශ්ලේෂණය | 44 |

# ආයතනික විස්තර

| | |
|---|---|
| සමාගමේ නම | - සීමා.මිල්කෝ (පුද්ගලික) සමාගම |
| නෛතික තත්ත්වය | - 1982 සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුල සංස්ථාගත සීමාසහිත වගකීම් සහිත පුද්ගලික සමාගමකි |
| ලියාපදිංචි කාර්යාලය | - අංක 45 නාවල පාර නාරාහේන්පිට කොළඹ 05<br>- දුර. 0112586174,0112582331-4, 0112586872<br>- ෆැක්ස් 0112368082, 0115333328<br>- වෙබ් අඩවිය www.milco.lk<br>- විදුලි තැපෑල info@milco.lk |
| කර්මාන්ත ශාලා | - කොළඹ කිරි කම්හල<br>- අඹේවෙල විසිරි වියලි කිරි කම්හල<br>- දිගන කිරි කම්හල<br>- පොලොන්නරුව උකුකිරි කම්හල |
| සංස්ථාගත කළ දිනය | - 1996 මැයි 09 |
| ප්‍රති ලියාපදිංචි කළ දිනය | - 2008 මැයි 19 |
| සමාගම් ලියාපදිංචි අංකය | - N (PVS) 17159 (පැරණි)<br>- PV 2942 (නව) |
| සමාගම් ලේකම් | - ෆිනෑන්ෂියල් සර්විසස් ඇන්ඩ් කොමර්ෂල් ඒජන්සීස්<br>අංක 28. රෝස්මීඩ් පෙදෙස, කොළඹ 07 |
| අධ්‍යක්ෂකවරු | - සුනිල් වික්‍රමසිංහ මයා — සභාපති<br>සංජය ලීලාරත්න මයා — නියෝජ්‍ය සභාපති<br>නව්ෂාද් ජුනෙයිදීන් මයා — අධ්‍යක්ෂක<br>ආර්. සිවරාම් මයා — අධ්‍යක්ෂක<br>එස්. ලෝගනාදන් මයා — අධ්‍යක්ෂක<br>අජිත් දිසානායක මයා — අධ්‍යක්ෂක<br>තිලංක වීරසිංහ මයා — අධ්‍යක්ෂක<br>දසිකා එඩ්වඩ් මිය — අධ්‍යක්ෂක<br>ඩබ්.පී.ආර්.එච්.පණ්ඩිතරත්න මයා — අධ්‍යක්ෂක |
| විගණකවරු | - අභ්‍යන්තර<br>එස්ජේඑම්එස් ඇසෝසියේට්ස්, අංක 02, කාසල් පටුමග,<br>කොළඹ 04<br>- බාහිර<br>බීඩීඕ පාට්නර්ස්, නො. 65/2, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,<br>කොළඹ 02 |
| බැංකුකරුවන් | - මහජන බැංකුව<br>ලංකා බැංකුව |

2011 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ කාර්යසාධන විමසුම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා අතිශයින්ම සතුටට පත්වෙමි.

සමාලෝචිත වර්ෂයට අදාළ සමාගමේ පිරිවැටුම පසුගිය වසරට වඩා 11.5% සැළකිය යුතු තලයේ වර්ධනයක් පෙන්වා ඇත. 2010/2011 කාලවල ලත් රු. මිලියන 4.2 ක් වූ පිරිවැටුම හා සංසන්දනාත්මක ව ගත්කළ රු. 4.7 ක සමස්ථ පිරිවැටුමක් ලබා ඇත.

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ ආදායම් බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 111 කි. මාස හයක කාලයක් සඳහා කාරක ප්‍රාග්ධනයක් ගොඩනංවා ගන්නා ලෙස මහා භාණ්ඩාගාරය විසින් කරන ලද ඉල්ලීමට අනුව, අද වන විට රු. මිලියන 935 ක මුදල් සංචිතයක් පවත්වා ගෙන යාමට සමාගමට හැකියාව ලැබී ඇත. කිරි, අමුද්‍රව්‍ය, ඇසුරුම්, පඩි නඩි ගෙවීම් වැනි කාර්යයන් සඳහා රු. බිලියන 2.1 ක මුදලක් අවශ්‍යව පවතී. වෙන් කර ඇති කාරක ප්‍රාග්ධන මුදල වසරකට 8.5 *9.0% ක් වන ආකර්ශනීය පොලී අනුපාත මත ලංකා බැංකුව, මහජන බැංකුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වැනි රාජ්‍ය බැංකුවල ස්ථිර තැන්පත් ලෙස බැංකුගත කර ඇත.

**කිරි එකතු කිරීම හා ප්‍රතිසම්පාදනය**
පැවති දරුණු ගංවතුර තත්වයන් හා ආසන්න වශයෙන් කිරි ගවයන් 75000 ක හිඟයක් පැවති නිසා පසුගිය වසරේ අවසාන භාගයේ දී හා මේ වසර ආරම්භක සමයේ කිරි එකතු කිරීමේ කාර්යයන් අඩාල විය. කෙසේ වුවද, මිල්කෝ සමාගමේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ අප්‍රතිහත කැපවීම හේතුකොටගෙන අද වන විට දිනකට ආසන්න වශයෙන් කිරි ලීටර් 185000 ක් සැළකිය යුතු වර්ධනීය තලයකට ගෙන ඒමට හැකි වී ඇත. ශ්‍රී ලංකාවේ සතර දිග්භාගයෙන්ම මිල්කෝ වෙත කිරි ලබා දෙන ගොවිපාලිත සමිති 2300 ක් හා දිවයින පුරා ශීතාගාර මධ්‍යස්ථාන 77 ක් හරහා කිරි ශීතාගාරගත කිරීමටත් ඒවා කර්මාන්තශාලා හතර වෙත ප්‍රවාහනය කිරීමත් සිදු වේ. එකතු කරන කිරි ප්‍රමාණයන්ගේ විස්තර පහත දක්වා ඇත.

| වසර | ලීටර් (මිලියන) | ප්‍රගතිය % |
|---|---|---|
| 2006 | 53.46 | |
| 2007 | 53.98 | + 0.97 |
| 2008 | 53.40 | -1.07 |
| 2009 | 54.85 | +2.71 |
| 2010 | 55.51 | +1.20 |
| 2011 අද වන විට | 32.56 | |
| 2011 තක්සේරු. | 61.80 | +11.33 |

**වර්ධනය**
කිරි එක්කාසු කරලීමේ කාර්යයන් වතු අංශයේ හා ගම්මාන තුලට විහිදී යාම අත්‍යාවශ්‍ය කරුණකි. එම ප්‍රදේශවල ලීටර් 300, 500 හා 1000 ධාරිතාවය සහිත සුළු පරිමාණ ශීතාගාර 25 ක් ඉදි කිරීමට අපේක්ෂිත ය. කිරි ගොවීන් හට නැවුම් කිරි ලීටරයකට ගෙවන මිල අවම ඝණද්‍රව්‍ය ප්‍රමාණය 12.5% සළකා මනා තත්වයෙන් යුතු කිරි ලීටරයක් වෙනුවෙන් රු. 50/= ක් ගෙවනු ලබයි. අද වන විට මෙසේ කිරි ගොවීන් හට කිරි සඳහා ගෙවනු ලබන මිල ලෝක වෙළඳපලේ පවත්නා මිලට අඩු වැඩි වශයෙන් වන ඉහළ මුදලකි. මෙකී පියවරයන්ට අමතරව, ස්වයං රැකියා ව්‍යාපෘතියක් ලෙස උදෑසන කාලයේ සුළු පරිමාණ ශීතාගාර වෙතින් කිරි එකතු කිරීමටත් නැවත හවස් වරුවේ මිල්කෝ නිෂ්පාදන අලෙවි කරලීම සඳහා ත්‍රි රෝද රථ 50 ක් යෙදවීමට සමාගම පියවර ගනිමින් සිටී. මෙමගින් දිනකට ආසන්න වශයෙන් රුපියල් 1000/= ක ආදායමක් උපයා දීමට සැළසුම් කර ඇත. සමාගමේ අලෙවි කටයුතු ව්‍යාප්ත කරලීමත් සමාජ සත්කාරක දායකත්වයක් ලෙස මෙම ව්‍යාපෘතිය දිවයින පුරා ගෙන යාමටත් සමාගම බලාපොරොත්තු වේ.

**නැවුම් කිරිවල ගුණත්වය**
උසස් ගණයේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ දී කිරිවල ප්‍රමිතිය මනා ලෙස ආරක්ෂා කිරීම අතිශයින්ම වැදගත් වේ. එහි පළමු පියවර ලෙස පසුගිය වසරේ අවසාන කාල සීමාවේ දී ශීතාගාර වල සිට කර්මාන්තශාලා තෙක් කිරි දිනපතා ගෙන යනු ලැබිනි.

ඊට අතිරේකව, නැවුම් කිරි ආශ්‍රිත නිෂ්පාදන හා මූලික සෞඛ්‍යානුකුල කිරි භාවිතාවන් පිළිබඳව ගොවි පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට පියවර ගෙන ඇත.

**නිෂ්පාදනය**
මිල්කෝ සමාගම සතුව නිෂ්පාදන කර්මාන්තශාලා හතරක් කොළඹ (නාරාහේන්පිට), දිගන, අඹේවෙල හා පොළොන්නරුවේ පිහිටුවා ඇත. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන සියල්ල ශ්‍රී ලංකාවේ කිරි ගොවීන්ගෙන් එකතු කරගත් නැවුම් කිරි වලින් නිමවා ඇත. "හයිලන්ඩ්" වෙළඳ නාමය යටතේ පාරිභෝගිකයන් හට නිෂ්පාදන ප්‍රභේද දහයක් (10) ක් හා තොග ඒකක පනස් දෙකක් (52) ක් ලබා ගැනීමේ අවස්ථාව ඇත. එම ප්‍රභේද වන්නේ පැස්චරීකරණය කරන ලද හා වාණුහරනයකරලද දියර කිරි, යෝගට්, අයිස් ක්‍රීම්, බටර්, එළගිතෙල්, චීස්, මුදවපු කිරි, ඝනීභූත කිරි හා පූර්ණ මේදය සහිත කිරිය. මෙහි සඳහන් කළ නිෂ්පාදන ගොන්නට අමතරව, " හයිලන්ඩ් ස්ප්‍රිං " නමින් පානීය ජලය හා චොකලට් හඳුන්වා දීම අපගේ බලාපොරොත්තුවයි.

**විකුණුම් හා අලෙවිය**

නිම් භාණ්ඩ බෙදා හැරීම සඳහා රට පුරා බෙදාහරින්නන් 115 ක් මිල්කෝ විසින් පත් කර ඇත. අලෙවි අංශය අලෙවි නියෝජිතයන් 26 ක්, කලාපීය කළමනාකරුවන් 07 ක් හා පරිපාලන නිළධාරින් 06 දෙනෙකු අතින් මෙහෙයවනු ලබයි. මීට අතිරේකව, කාර්ය මණ්ඩල සාමාජිකයන් 50 කින් සමන්විත අලෙවි මධ්‍යස්ථාන 11 ක් සමාගම සතුව ඇත. මේ සඳහා රට කලාප 09 කට බෙදා වෙන් කර ඇති අතර නිෂ්පාදන අලුත් කිරීම් හා නව නිෂ්පාදන හඳුන්වාදීම අඛණ්ඩව සිදු කරනු ලබයි. “මේදය රහිත හා සීනි රහිත” යෝගට් විශේෂයක් මෑතකදී වෙළඳපලට හඳුන්වා දී ඇති අතර එය ක්‍රමානුකූලව පාරිභෝගිකයන් අතර ජනප්‍රියත්වයට පත් වෙමින් පවතී. තවද, ස්ට්‍රෝබෙරි රසැති යෝගට් වර්ගයක් හඳුන්වා දීම සඳහා පාරිභෝගික රසඥතා පරීක්ෂා කිරීමේ කාර්මික අත්හදා බැලීම් මේ වන විට සිදු කර අවසන් කර ඇත. නිෂ්පාදන නවීකරණය අතින් ගත් කළ, ජාත්‍යන්තර තලයෙන් යුත් “ හයිලන්ඩ් මිල්ක් මයිට් ” වෙළඳ නාමය යටතේ ඝනීභූත කිරි විශේෂයක් හඳුන්වා දී ඇත. මාස 09 ක කෙටි ආයුෂ කාලයක් සහිත මෙම නිෂ්පාදනය විදේශීය වෙළඳපල අරමුණු කොට නිපදවා ඇත. අඩු කැලරි ප්‍රමාණයක් ඇති අයිස් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අත්හදා බැලීම් සිදු කිරීමට වැඩිදුරටත් කටයුතු කරමින් පවතී.

**යූඑච්ටී (UHT)**

මසක කාලයක් රාක්කවල තබා ගත හැකි දිගු කාලීන යූඑච්ටී කිරි නුදුරු අනාගතයේ හඳුන්වාදීමට හැකිවීම අතිශයින්ම වැදගත් වර්ධනීය පියවරකි. අද පවත්නා පැස්චරීකරණය කරන ලද දියර කිරි තබා ගත හැක්කේ දින තුනක් (3) ක් පමණක් වන නිසා එම කෙටි ජීව කාලය සළකා ඒවා බෙදා හැරීම අපහසු කාර්යයක් බවට පත් වී ඇත. මූලික නිකුත් කිරීමේ දී රු. 25/= ක් මිල වන මි.ලී. 180 (රස 2 ක් සහිත), රු. 50/=ක් මිල කර ඇති මි.ලී. 450 ක් සහ මි.ලී. 900 කින් යුතු රු. 90/= ක් වන ඇසුරුම් වර්ග තුනක් ලෙස ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. මෙතෙක් කල් කිරි පිටි භාවිතයට හුරුව සිටි අප පාරිභෝගිකයන් ද්‍රව කිරි භාවිතයට හුරු කර වන සමයක ආරම්භය මෙය වේ.

**මිල්කෝ කාර්ය මඩුල්ල**

“ වෘත්තීය ප්‍රවේශ සංවර්ධනය ” ඇති කරලීම අප කාර්ය මණ්ඩලය සඳහා අතිශය අවශ්‍ය වි ඇති දෙයකි. විවිධ වෘත්තීය තලයන් වලට අයත් කාර්ය මණ්ඩලයන් උදෙසා පුහුණුවීම් දැනටමත් අරඹා ඇත. වර්ෂාවසාන කාර්ය මණ්ඩල ඇගයීම් කරලීම සඳහා ප්‍රමුඛ කාර්යසාධන දර්ශකයන්ගෙන් සමන්විත කාර්යසාධන සංවර්ධන මාර්ගෝපදේශයක් සැකසීමට බලාපොරොත්තු වේ. අත්දැකීම් වලින් පිරිපුන් කාර්ය මඩුල්ලක් යනු මිල්කෝ අපට සම්පතක් වනවා වන අතර සමාගම තුල සියලූ සේවා බාණ්ඩයන්ට 1460 කින් යුත් සේවක පිරිසකින් සමන්විතය.

**ඉදිරි ගමන**

ශ්‍රී ලංකානු ජනතාව හට අවශ්‍ය කරන පෝෂ්‍යදායී ආහාර ලබා දීම සඳහා මිල්කෝ සමාගම ඇපකැප වී සිටි. අත දරුවාගේ සිට මහලු වියේ පසුවන්නන් දක්වා සමාජයේ සිටින සියලූ ආකාර වල පාරිභෝගික කණ්ඩායම් සඳහා නිෂ්පාදන පෙලක් මිල්කෝ නිපදවා ඇත. ඒවා “ජනප්‍රියට පත් වූ නිෂ්පාදන” තේමා පාඨය යටතේ සකසා ඇත. හුදු “ආහාර පාන සමාගමක” තත්වයේ සිට ජාතියට පෝෂණය සපයන ”පෝෂ්‍යදායි ආහාර පාන සමාගමක්” බවට මිල්කෝ පත් වී ඇත. ජනයාට සේවය සළසන හා ආයතනය ආරක්ෂා කරන ශ්‍රී ලංකාවේ පළමු පංතියේ සමාගම බවට පත්වීමේ මගසළකුනු මිල්කෝ සමාගම දැනටමත් පහල කර ඇත.

**පොදු**

ජයග්‍රාහී මාවතට පිවිසීම සඳහා සුළු කරුණු කිහිපයක් පමණක් සපුරා ලීමට මිල්කෝ හට සිදු වී ඇත. සමාගමේ වර්ධනය අඩාල කරවන ප්‍රමාණවත් නැවුම් කිරි ප්‍රමාණයක් රටේ නොමැතිවීම ප්‍රධාන බාධකය බවට පත් වී ඇත. රටේ කිරි ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයේ සියයට පනහක අලෙවි දායකත්වය තම අතට ගැනීම අපගේ ප්‍රධාන ඉලක්කයයි. වාර්ෂිකව සාමාන්‍යයෙන් ඇ.ඩො. 390 වටිනා කිරි නිෂ්පාදන ආනයන කරනලදි. මෙම ආනයනය නවත්වා විදේශ විනිමය ඉතිරි කිරීම සඳහා තව දුරටත් කිරි ලීටර් මිලියන 600 ක් දේශීයව නිෂ්පාදනය කල යුතුව ඇත.

දැනට එය ලීටර මිලියන 125 ක් ලෙස රදා පවතී. තාක්ෂණිකව මෙම කාර්යය භාරයට ලඟාවිය හැකිය. පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා බොහෝ කාර්යයන් ගණනාවක් සිදු කර ඇත. අපගේ බලාපොරොත්තුව 2015 වනවිට කිරිවලින් ස්වයංපෝෂිත වීමයි.

අවසාන වශයෙන්, මිල්කෝ ඉදිරි ගමන වෙනුවෙන් දායකත්වය සපයන සැමට විශේෂයෙන් කිරි ක්ෂේත්‍රයේ නිරත සියලූ දෙනා හට මිල්කෝ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් මා ස්තුතිවන්ත වෙමි.

**සුනිල් වික්‍රමසිංහ**
සභාපති
සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම

# නියෝජ්‍ය සභාපතිතුමාගේ පණිවිඩය

මිල්කෝ ආයතනයේ 2011 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට සමාගමේ නියෝජ්‍ය සභාපතිවරයා වශයෙන් පණිවිඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි.

රජයට පවරාගත් ආයතනයක් වශයෙන් අපට සම්පූර්ණ කළ යුතු මෙහෙවරයන් දෙකක් ඇත. පළමු සහ පුමුඛතම කාර්යය වන්නේ අපගේ නිෂ්පාදනයන් පිළිබඳ විශ්වාසය තබා ඇති පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම වන අතර දෙවැන්න වන්නේ ආයතනයට සෘජුවම සම්බන්ධ කිරි ගොවියන් සුරක්ෂිත කිරීමයි.

එසේවුවත්, අප වෙත ඇති මහත් වූ වගකීම වන්නේ 1500ට වැඩි සේවකයින්ගේ රැකියාවන් ආරක්ෂා කිරීමයි. පෞද්ගලික අංශය මෙන් අප ආයතනය ලාභ ඉලක්ක නොකලද අපගේ අභිප්‍රාය වන්නේ අපගේ වටිනා පාරිභෝගිකයින්ට පෝෂ්‍යදායි උසස් තත්ත්වයේ නිෂ්පාදන ලබාදීමයි.

වාසනාවකට මෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ ඉහළ කළමනාකාරිත්වය අවසාන පාරිභෝගිකයා මත බර පැටවීමක් සිදු නොකර කිරි ගොවියන් ධෛර්යමත් කිරීමේ අරමුණින් ඔවුනට සිදුකරන ගෙවීම් ඉහළ දැමීම සඳහා බුද්ධිමත් තීරණයක් ගෙන ඇත. එමනිසා අප ආයතනය සතු තාක්ෂණය භාවිතා කරමින් නිෂ්පාදන ධාරිතාවය ඉහළ නංවමින් සමාගම තුල ඵලදායිතාවය සහ කාර්යසාධන වර්ධනය ඉහළ නංවමින් පිරිවැය දැරීම සඳහා උත්සාහ කරමින් සිටී. පසුගිය වර්ෂය හා සැසැඳීමේදී අප සමාගම සදාචාරව මෙහෙයවූ ආකාරයෙහි ඔප්පුකළ හැකි වෙනසක් දක්නට ඇත.

අවසාන වශයෙන්, ගරු ඇමතිතුමාට, නියෝජ්‍ය ඇමතිතුමාට, අධ්‍යක්ෂ මංඩලයට, වෘත්තීය සංගම්වලට සහ සමාගමේ සාර්ථකත්වයට දායක වූ සමස්ථ කාර්යය මංඩලයට මාගේ හදපිරි කෘතඥතාවය පළකිරීමට කැමැත්තෙමි.

**සංජය ලීලාරත්න**
නියෝජ්‍ය සභාපති
මිල්කෝ (පුද්ගලික) සමාගම

# ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ පණිවිඩය

2010 මැයි මාසයේදි මිල්කෝ (පුද්ගලික) සමාගමේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ වශයෙන් රාජකාරි භාරගෙන මෙම පණිවිඩය ලියමි.

අපට මිල්කෝ ආයතනය වශයෙන්  ගරු ඇමතිතුමා, ලේකම්තුමා සහ අමාත්‍යංශයේ කාර්යය මංඩලය මෙන්ම සමාගමේ සභාපති, නියෝජ්‍ය සභාපති සහ සියලූම ශ්‍රේණිවලට අයත් කාර්යය මංඩලයේ සහයෝගයෙන් ඉදිරියට ගමන් කිරිමට හැකියාව ලැබී ඇත.

මා මෙම අවස්ථාවේදී අපගේ ඉලක්ක සපුරා ගැනීමට දායක වීම සහ දෙන ලද සහයෝගය වෙනුවෙන් ස්තූතිය පිරිනමන්නෙමි.

නැගෙනහිර පලාතේ විනාශකාරි ගංවතුර හේතුවෙන් යම් බාධා-වන් ඇතිවුවද මිල්කෝ සමාගම එහි සේවකයන්ගේ, අමාත්‍යංශයේ සහ ගරු ඇමතිතුමාගේ උත්සාහය නිසා එයට මුහුණාදීමට හැකිවිය.

කිරි නිෂ්පාදනයේ යෙදී සිටින කිරි ගොවියන් උනන්දුකර ධෛර්යමත් කිරීම සඳහා කිරි ගැණුම් මිල සැලකියයුතු මට්ටමකින් ඉහළ නංවන ලදී. කිරි මිල ඉහළ දැමීමෙන් පසු ගොවීන් වැඩි පිරිසක් කිරි නිෂ්පාදනයේ යෙදී සිටින බව මාගේ විශ්වාසයයි.

ජාතික පශු සම්පත් මංඩලයේ ගොවිපලවල අමාත්‍යංශය විසින් ආරම්භ කිරිමට යෝජිත විශාල කිරි ගොවිපලවල් මිල්කෝ ආයතනයට විශාල ප්‍රමාණයෙන් ගුණාත්මක කිරි මිලදී ගැනීමට උදව් විය හැකි අතර එය කිරි නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන ආනයන වියදම අඩුකර ගැනීමට උදව් විය හැකිය.

මිල්කෝ (පුද්ගලික) සමාගමේ සියලුම කටයුතු සාර්ථක වීමට ප්‍රාර්ථනා කරන අතර යෝජිත අරමුණු කරා ලගාවීමට දායක වූ සමස්ථ සේවකයන් අගය කරමි.
මාගේ උණුසුම් ශුභ පැතුම්

**නවුෂාර්ඩ් ජුනෙයිදීන්**
ක්‍රියාකාරි අධ්‍යක්ෂ
මිල්කෝ (පුද්ගලික) සමාගම

# කොළඹ
# කර්මාන්තශාලා කළමණාකරුගේ පණිවිඩය

2010/2011 වර්ශය තුලදී කොළඹ කිරි කම්හල සංවිධානයේ සමස්ථ කාර්යය සාධනය වඩා යහපත් කිරිම සදහා එහි කාර්යය සාධනය නැවත සකස් කර ඇත. කාර්යය රාමුව නැවත සකස් කිරීමත් සමගම පිරියත සහ යන්ත්‍ර සදහා ගෙවීමක් නොමැතිවම ආදායම් ඉපයීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් යෝගට් නිෂ්පාදනය උපරිම හැකියාවෙන් පවත්වාගෙන යාමට කොළඹ කිරි කම්හලට හැකි විය. පැරණි උපකරණ වෙනුවට නව යන්ත්‍ර සවිකරමින් සහ නිෂ්පාදන ක්‍රියාවලිය දියුණු කරමින් රු. මිලියන 17ක පිරිවැයට අඛණ්ඩව අයිස්ක්‍රීම් ශීතකරණ දෙකක් හදුන්වාදීමත් සමගම අයිස්ක්‍රීම් නිෂ්පාදනය වැඩිවිය. පැරණි යකඩ ඇසුරුම් පෙට්ටි වෙනුවට මිලදීගත් ප්ලාස්ටික් ඇසුරුම් පෙට්ටි භාවිතයත් සමගම ජීවානුහරණය කරන ලද කිරි බෝතල් බෙදා හැරීමේ තත්ත්වය ඉහළ දැමීමට හැකි විය.

ප්‍රධාන කාර්යාලයේ පර්යේෂණ සහ සංවර්ධන අංශය විසින් සිදුකළ අප්‍රතිහත උත්සාහයේ ප්‍රතිපලයක් වශයෙන් සීනි රහිත මේදය රහිත යෝගට් සහ ස්ට්‍රෝබෙරි යෝගට් නමින් නව නිෂ්පාදන දෙවර්ගයක් හදුන්වා දීමට අපට හැකිවිය.

1956 ජාතික කිරි මංඩලය ආරම්භයේදීම විවෘතකළ මෙම කම්හල මේ වන විට විවිධ නිෂ්පාදන සමග පුළුල් කර ඇති අතර පිහිටීම සැලකිල්ලට ගන්නාතාක් දුරට එය සන්තෘප්ත ස්ථානයක් බවට පත්වී ඇත. විශේෂයෙන් ගබඩා අවශ්‍යතාවයන් ආදිය සැලකිල්ලට ගන්නා විට ධාරිතාවය පුළුල් කිරිම සදහා ගොඩනැගිලිවල භෞතික ප්‍රමාණය පුළුල් කිරිමේ අවශ්‍යතාවක් පවතී. එසේ වුවත්, එම කාලයේදී ජනාකීර්ණ ප්‍රදේශයක් නොවූ නාරාහේන්පිට පිහිටුවා ඇති කම්හලෙහි වර්තමාන තත්ත්වය සම්පූර්ණයෙන්ව වෙනස් වේ.

මෙකී කරුණු සැලකිල්කට ගනිමින් මෙම කම්හල නවීන තාක්‍ෂණය සමගින් කොළඹ නගරයෙන් පිටත නව ස්ථානයකට ගෙන යාමට සැළසුම් සකස් කර ඇත. සමාගම් ඉතිහාසයේ වැදගත්ම සන්ධිස්ථානයක් විය හැකි මෙය නිෂ්පාදන ක්‍රියාවලිය විශාල ප්‍රමාණයකින් ඉහළ දැමීමට හේතු විය හැකිය.



**සුදත් මුණසිංහ**
කර්මාන්තශාලා කළමණාකරු, - කොළඹ කිරි කම්හල
මිල්කෝ (පුද්ගලික) සමාගම

මිල්කෝ ආයතනයේ 2010/2011 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්ථාවට පණිවිඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි.

දේශීය පාරිභෝගික ජනතාව වඩාත් නැඹුරුව සිටින කිරි පිටි භාවිතයේදී ඔවුන් වඩාත් ප්‍රියකරන "හයිලන්ඩ්" කිරිපිටි සහ බටර් අප අඹේවෙල කර්මාන්තශාලාවේදී නිෂ්පාදනය කරනු ලබන අතර මිල්කෝ ආයතනය මගින් එකතු කරනු ලබන කිරි වලින් 60% පමණ යොදාගැනේ. අනුරාධපුරය, පොලොන්නරුව, මඩකලපුව, අම්පාර, මොනරාගල, බදුල්ල, නුවරඑළිය යන දිස්ත්‍රික්ක වල කිරි ගොවිජනතාව විසින් සපයනු ලබන කිරිවලින් ඉතා සෞඛ්‍යාරක්ෂිතව, ඉහල ගුණාත්මකභාවයෙන් යුතුව මෙම කිරිපිටි සහ බටර් නිෂ්පාදනය කරනු ලබන අතර එයට හොඳම නිදසුන වශයෙන් ආහාර ආරක්ෂණ කළමණාකරන ක්‍රමවේදය වෙනුවෙන් ලබා දෙන ISO- 22000 තත්ව සහතිකයෙන් පිදුම් ලබා තිබීම ගැන සඳහන් කරනුයේ මහත් ආඩම්බරයෙනි.

2010/2011 වර්ෂයේදී අප කර්මාන්තශාලාවේ නිෂ්පාදනවලින් රුපියල් මිලියන 211 ක ශුද්ධ ලාභයක් ලබමින් ආයතනයේ ඉදිරි ගමනට දායකත්වය ලබා දී ඇති බවද සඳහන් කරමි. මෙවන් ප්‍රගතියකට උරදුන් මනා දැනුමකින් හා පළපුරුද්දකින් යුත් කර්මාන්තශාලාවේ සේවක කාර්යය මණ්ඩලය මේ අවස්ථාවේදී මම කෘතවේදීව සිහිපත්කරන්නට කැමැත්තෙමි.

ඉදිරියේදී ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය වැඩිවීමත් සමග අපගේ අනෙක් කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කෙරෙන දියර කිරි සහ අගය වැඩිකරන ලද කිරි නිෂ්පාදන වලට එම කිරි යොදා ගැනීමෙන් පසු අතිරික්ත වන කිරි අඹේවෙල කර්මාන්තශාලාවේදී කිරිපිටි සහ බටර් නිෂ්පාදනය සඳහා අනිවාර්යයෙන්ම යොදාගත යුතු වේ. මේ සඳහා කර්මාන්තශාලාවේ යන්ත්‍ර සූත්‍ර ද ඉදිරියේදී යම් නවීකරණයකට ලක් කල යුතුව ඇත.

අවසාන වශයෙන් මිල්කෝ ආයතනයේ කොඳුනාරටිය ශක්තිමත් කිරීමට කොටස් කරුවකු වශයෙන් දායකත්වය ලබා දෙමින් කරන්නාවූ මෙහෙවර ඉදිරියටත් ඉටුකරලීම අපගේ අරමුණයි.

**ඒ.එන්. පින්නලන්ද**
කර්මාන්තශාලා කළමණාකාර - අඹේවෙල
මිල්කෝ (පුද්ගලික) සමාගම

# දිගන
# කර්මාන්තශාලා කළමණාකරුගේ පණිවිඩය

ප්‍රධාන වශයෙන් යෝගට් සහ අයිස්ක්‍රීම් නිෂ්පාදනයේදී පසුගිය වර්ෂය හා සසදන කළ 2010/2011 කාල පරිච්ඡේදය තුළදී දිගන කිරි කම්හලේ සමස්ථ කාර්යය සාධනය පිළිබඳව සෑහීමට පත්විය හැකිය.

නවීන තාක්ෂණය හඳුන්වා දෙමින් කර්මාන්ත ශාලාවේ ඵලදායිතාවය ඉහළ නැංවීමට සැළසුම් ක්‍රියාත්මක වෙමින් පවති. දියර කිරි ක්‍රියාවලිය මත පදනම්ව නව යූඑච්ටී ක්‍රමවේදය ආරම්භ කිරීම තුළින් මෙම අරමුණු ඉටු කරගනු ලැබේ. යෝගට් සහ අයිස් ක්‍රීම් නිෂ්පාදන ධාරිතාවය නව යන්ත්‍රසූත්‍ර හඳුන්වා දීමෙන් දෙගුනයක් දක්වා වර්ධනය වී ඇත. ඉහත අරමුණු කරා ලගාවීම සඳහා සියළුම මට්ටමේ සේවකයින් අභිප්‍රේරණය කිරීම අත්‍යවශ්‍ය වේ.

යෝගට් සහ අයිස් ක්‍රීම් නිෂ්පාදන හැකියාව පහත වගුව පරිදි වේ.

| නිෂ්පාදන | 2007/2008 | 2008/2009 | 2009/2010 | 2010/2011 |
|---|---|---|---|---|
| යෝගට් :මි.ලි.80) | 10,044,064 | 10,767,619 | 13,114,715 | 14,245,333 |
| අයිස් ක්‍රීම් (ලීටර) | 1,755,830 | 2,101,976 | 2,370,809 | 2,280,411 |

| නිෂ්පාදන | 2007/2008 | 2008/2009 | 2009/2010 | 2010/2011 |
|---|---|---|---|---|
| යෝගට් අලෙවිය (රු.) | 10,044,064 | 10,767,619 | 13,114,715 | 14,245,333 |
| අයිස් ක්‍රීම් අලෙවිය (රු) | 1,755,830 | 2,101,976 | 2,370,809 | 2,280,411 |

යෝජිත ව්‍යාපෘතීන් ක්‍රියාත්මකවීම සහ උසස් අභිප්‍රේරිත කාර්යය මංඩලයක් සමගම දිගන කිරි කම්හල ලාභදායි නිෂ්පාදන ආයතනයක් වනු ඇත.

**ආර්.එම්.ජේ.බී.රත්නායක**
කර්මාන්තශාලා කළමණාකරු(වැ.බ.) - දිගන
මිල්කෝ (පුද්ගලික) සමාගම

# පොළොන්නරුව කර්මාන්තශාලා කළමණාකරුගේ පණිවිඩය

2010/2011 මුදල් වර්ෂයේ වාර්ෂික වාර්තාවට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මාහට ඉමහත් සතුටකි.

2008 වර්ෂයේ සිට මෙම කම්හලේ කාර්යයන් භාර ගැනීමෙන් අනතුරුව මිල්කෝ සමාගම 'හයිලන්ඩ්' වෙළෙඳ නාමය යටතේ උකකිරි නිෂ්පාදනය ආරම්භ කර ඇත. පසුගිය කාලයේදී හයිලන්ඩ් උකුකිරි සඳහා එස්එල්එස් ප්‍රමිති සහතිකය සඳහා සුදුසුකම් ලබා ඇත.

2010/2011 කාලය තුළදී පාරිභෝගික පහසුව සඳහා උකුකිරි ඇසුරුමේ සුළු වෙනස්කම් කිහිපයක් සිදු කරන ලදී. අප විසින් උකුකිරි ටින් එක පහසුවෙන් විවෘත කිරීමේ ක්‍රමයක් හඳුන්වා දුන් අතර එය ආකර්ෂණීය ලෙස සකසා 'හයිලන්ඩ් මිල්ක්මයිට්' ලෙස නැවත නම් කරන ලදී. මෙම ගුණයෙන් පිරි හයිලන්ඩ් මිල්ක් මයිට් කි.ග්‍රෑම් 5 අසුරුම් පැණිරස නිෂ්පාදකයන් අතරේ ඉතාම ජනප්‍රිය වී ඇති අතර විශාල සහ කුඩා හෝටල් හිමියන් බොහෝ දෙනෙක් ක්ෂණික සහ ප්‍රනීතවත් කිරි කෝප්ප-යක් සෑදීම සඳහා අපගේ උකුකිරි භාවිතා කරනු ලැබේ.

2011 වර්ෂය තුළදී අප සමාගම විසින් පින්ලන්තයෙන් UHT කිරි නිෂ්පාදන යන්ත්‍ර දෙකක් සඳහා ආයෝජනය කිරීම ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනයේදී තබන ලද යෝධ පියවරකි. මෙම ආයෝජනයේ අරමුණ වූයේ කිරිපිටි නිෂ්පාදනය අවම කරමින් ජනතාව සඳහා ඉතා පෝෂ්‍යදායී දියර කිරි නිෂ්පාදනය කිරීමයි. රජයේ ප්‍රතිපත්ති මත රැඳෙමින් පිටිකිරි වෙනුවට සෑම නිවසකම දියර කිරි භාවිතා කිරීමට උනන්දු කරවීම අපගේ බලාපොරොත්තු වේ.

මෙම UHT යන්ත්‍ර දෙකෙන් එකක් අප කම්හලේ සථාපිත කර ඇති අතර දැනටමත් දියර කිරි නිෂ්පාදනය ආරම්භ කර ඇත. එහි අනෙක් යන්ත්‍රය අපගේ දිගන පිහිටි කම්හලේ ස්ථාපිත කරනු ලබන අතර මෙම යන්ත්‍ර දෙකෙන්ම මාසයක කාලයක් නරක් නොවී කාමර උෂ්ණත්වයෙන් තබාගත හැකි යූඑච්ටී දියර කිරි නුදුරු අනාගතයේදී දිවයිනේ ඕනෑම ස්ථානයකින් ලබා ගත හැකි වේ.

මේ අතර 2012 වර්ෂය තුළදී උතුර, උතුරු මැද හා නැගෙනහිර සඳහා අපගේ කම්හලේ යෝගට් සහ අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමට අප සැළසුම් සකස් කරමින් සිටිමු.

අවසාන වශයෙන් මෙම කම්හලට අයත් ඉහළ කළමණාකාරිත්වය, සේවයට කැපවුනු දක්ෂ කාර්යය මංඩලයේ සහයෝගයෙන් මිල්කෝ ආයතනයේ ඉතා සාර්ථකම ඒකකය මෙම කම්හල විය හැකි බව මා හට සඳහන් කළ හැකිය.

**ඒ.වී.ආර්. අබේසිංහ**
වැඩබලන කර්මාන්තශාලා කළමණාකරු - පොළොන්නරුව
මිල්කෝ (පුද්ගලික) සමාගම

# මුදල් පාලකගේ සමාලෝචනය

2011 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මිල්කෝ(පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාවට මෙම සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම මාහට ඉමහත් සතුටකි.

ශ්‍රී ලංකාව තුළ පවතින රජයට අයත් එකම කිරි නිෂ්පාදන සමාගම වන්නේ මිල්කෝ ආයතනයයි. අපගේ අඛණ්ඩ උත්සාහය වන්නේ කිරි ගොවියන්ට සාධාරණවිය හැකි මිලක් ඔවුන්ගේ කිරි සඳහා ගෙවීම වන අතර ශ්‍රී ලංකාවේ ජනතාව සඳහා පෝෂ්‍යදායී නිෂ්පාදනයන් සිදු කිරීමයි. අපගේ මුඛ්‍ය අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පෝෂ්‍යදායී ආහාර සහ බීම සමාගම් අතර පළමු පන්තියේ තත්ත්වයට පත්වීමයි.

මෙම වර්ෂය තුළදී ගොවියන්ගේ නිෂ්පාදන සඳහා ගෙවන ලද මිල දෙවරක් වැඩි කරන ලදී. කිරි ලීටර් 1ට රු. 31/=ක් වූ මිල රු. 35/=ක් දක්වා 10ක වැඩිවීමක් 2010 ජූනි 22 දින ලබා දෙන ලදී. තව දුරටත් 2010 මාර්තු 01 දින 'මහින්ද චින්තනය' අනුව යමින් මෙම මුදල රු. 50/= දක්වා වැඩිකළ අතර එහි වර්ධක අනුපාතය 42.85%ක් විය. වර්තමානයේ ජාතික කිරි මංඩලයේ සිට මිල්කෝ ආයතනය දක්වා ඉතිහාසයේ ඉහළම වර්ධක අනුපාතය ලෙස මෙය රැඳී පවතී. එසේ වුවත් මිල්කෝ ආයතනය රජයේ ඉල්ලීම වන ජනතාවගේ ජීවන වියදම ස්ථාවර වට්ටමක තබා ගැනීමේ අරමුණ අනුව පරිභෝගික මිල ගණන් ඉහළ නොදැමූ අතර මේ සඳහා වන වියදමින් කොටසක් රජයෙන් ප්‍රතිපූරණය කරගෙන ඉතිරි මුදල වන රු.මිලියන 81 සමාගම විසින් දරන ලදී.

වර්ෂය තුළදී දෙවරක් කිරි ගොවියන්ගේ නිෂ්පාදන සඳහා මිල ඉහළ දැමීම හේතු කොට ගෙන අප සමාගම ග්‍රාමීය ආර්ථිකයට රු. මිලියන 1,847කින් එනම් පසුගිය වර්ෂය හා සැසැඳීමේදී 8.05%ට වැඩි දායකත්වයක් ලබා දී ඇත. නමුත් 2010 වර්ෂය තුළ නැගෙනහිර පලාතට බලපෑ දඩි ගංවතුර හේතුවෙන් අමු කිරි එකතු කිරීම 2.43%කින් පහත වැටී ඇත.

ගොවි නිෂ්පාදන මිල ඉහළ දැමීමට අමතරව, සමාගමේ කිරි ප්‍රසම්පාදනය සහ ආශ්‍රිත ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම , නව ගොවි ස්වයංපෝෂිත සමිති ඇති කිරීම සහ කොළඹ, දිගන, අඹේවෙල සහ පොලොන්නරුව පිහිටා ඇති කම්හල් වෙත නැවුම් කිරි රැගෙන ඒම සඳහා කාර්යක්ෂම බවුසර් ප්‍රවාහන ජාලයක් හඳුන්වාදීම මගින් තව දුරටත් පුළුල් කරන ලදී. එමෙන්ම අමාත්‍යංශය සහ රාජ්‍ය නොවන සංවිධාන විශේෂයෙන් වර්ල්ඩ් විෂන් ආදී ආයතන හරහා සෘජු මූල්‍ය ආධාර කිරි ගොවියන් වෙත ලබා දෙන ලදී.

තව දුරටත්, මිල්කෝ ගොවි සමාජ ආරක්ෂණ අරමුදල හරහා අප ගොවීන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා විශාල ප්‍රතිලාභ ලබාදෙමින් සැලකිය යුතු ප්‍රමාණයක වියදම් දරමින් සිටිමු.

මෙම මුදල් වර්ෂය අවසානයේදී මිල්කෝ ගොවි සමාජ ආරක්ෂණ අරමුදල වර්ධනය වී ඇති අතර එහි අරමුදල රු. මිලියන 41.5ක් දක්වා පුමාණයක් දක්වා වර්ධනය වී ඇත. එහි සාමාජිකත්වය කිරි ගොවීන් 56,090කින් සමන්විත වන අතර ඔවුන් ගොවීන්ගෙන් කිරි ලීටරයට ශත 25 බැගින් සහ මිල්කෝ සමාගම විසින් එම ප්‍රමාණයට සමාන මුදලක දායකත්වය සහිතව 2003/2004 වර්ෂයේ සිට ආරම්භ කර ඇති ගොවි කළමණාකරණ සංගම් 1,805 යටතේ එකතුවී ඇත.

**ඉහත විස්තර කරන ලද කිරි නිෂ්පාදනයට අදාළ පිරිවැය පහත පරිදි වේ.**

| | 2010/11 වර්ෂය | 2009/10 | වැඩිවීම අඩුවීම | % |
|---|---|---|---|---|
| කිරි පාරිභෝජනය ලි. රු.මි. | 53.19 | 54.52 | (1.33) | (2.43)% |
| ගැණුම් මිල (සාමාන්‍ය) | 34.73 | 31.35 | 3.38 | 10.78% |
| කිරි සඳහා ගෙවීම් රු.මි. | 1,846.9 | 1,709.3 | 137.6 | 8.05% |
| ශීතකරණ පිරිවැය රු.මි. | 295.3 | 273.2 | 22.10 | 8.08% |
| සංවර්ධිත පිරිවැය රු.මි. | 138.6 | 135.9 | 2.10 | 1.54% |
| බවුසර් පිරිවැය රු.මි. | 163.8 | 144.4 | 19.40 | 13.43% |

මූල්‍ය විශ්ලේෂණය

අනෙකුත් පිරිවැය තුළ උද්ධමන වැඩිවීම හේතුවෙන් මෙම වර්ෂයේද පහත වැඩිවීම් සැලකිය යුතුවේ.

| | 2010/11 | 2009/10 | වැඩිවීම | % |
|---|---|---|---|---|
| අනෙකුත් අමු ද්‍රව්‍ය | 386.7 | 359.7 | 27.0 | 7.50% |
| ඇසුරුම් ද්‍රව්‍ය | 410.0 | 386.2 | 23.8 | 6.16% |
| ශ්‍රම පිරිවැය | 430.4 | 370.6 | 59.8 | 16.13% |
| දැව් තෙල් | 118.0 | 106.7 | 4.7 | 10.59% |
| කම්හල් නඩත්තු වියදම් | 142.4 | 137.7 | 4.7 | 3.41% |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | 130.0 | 100.0 | 30.0 | 30.00% |

මේ කාලය තුළ පහත පිරිවැය අයිතමයන් අමු කිරිවල අවම පාරිභෝජනය සහ අනෙකුත් තාක්ෂණික සාධක හේතුවෙන් පහත වැටී ඇත.

| | 2010/11 වර්ෂය | 2009/10 | වැඩිවීම | % |
|---|---|---|---|---|
| විදුලිය | 86.7 | 89.1 | 2.4 | 2.69% |
| ඩීසල් | 2.8 | 4.7 | 1.9 | 40.42% |
| ජලය | 16.7 | 19.6 | 2.9 | 14.79% |
| පවිත්‍රකාරක සහ පිරිසිදු කිරීම | 14.2 | 15.3 | 1.1 | 7.18% |

**පිරිවැටුම**

2009/10 වර්ෂය හැර 1999/2000 වර්ෂයේ සිට මිල්කෝ ආයතනය එහි පිරිවැටුම අඛණ්ඩව වැඩිකරගෙන ඇත. 2009/10 වර්ෂයේදී වුවද 0.82ක් එනම් මිලියන 35කින් පමණක් අඩු වී ඇති අතර නැවත 2010/2011 වර්ෂයේදී එය පෙර වර්ෂය හා සැසැඳීමේදී 11.06%කින් වැඩි වී ඇත.

| වර්ෂය | දළ විකුණුම් :රුමිලියන | වර්ෂය | දළ විකුණුම් :රුමිලියන |
|---|---|---|---|
| 99/2000 | 1.163 | 2005/06 | 2.362 |
| 2000/01 | 1.259 | 2006/07 | 2.847 |
| 2001/02 | 1.548 | 2007/08 | 3.348 |
| 2002/03 | 1.562 | 2008/09 | 4.248 |
| 2003/04 | 1.760 | 2009/10 | 4.213 |
| 2004/05 | 2.264 | 2010/11 | 4.680 |

**ලාභ දායිත්වය**

සමාගම වර්ෂය සඳහා පහළ මායිමක් වශයෙන් රු. මිලියන 83ක ශුද්ධ ලාභයක් උපයා ඇති අතර එසේ ලාභ ඉපයුවේ දේශිය කිරි ගොවියන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමත් ඔහුන්ගේ ජීවන වියදම ක්‍රමානුකූලව පවත්වා ගැනීමත් අරමුණු කර ගනිමින් ගොවිපල නිෂ්පාදන මිල දෙවරක් වැඩිකිරීමක් සිදු කිරීමෙනි. ඒ අනුව නිෂ්පාදනයේ වර්ධිත පිරිවැය සහ අනෙකුත් පරිපාලන වියදම් පහත සඳහන් වේ.

| වර්ෂය | දළ ලාභය රු.මිලියන | ශුද්ධ ලාභය රු.මිලියන |
|---|---|---|
| 2006/07 | 257 | 18 |
| 2007/08 | 452 | 104 |
| 2008/09 | 731 | 332 |
| 2009/10 | 697 | 301 |
| 2010/11 | 537 | 83 |

පිරිවැයෙහි පහත වැඩිවීම් සමාලෝචනයට අදාළ වර්ෂයේ සමාගමේ ශුද්ධ ලාභය අඩු කිරිමට හේතු වී ඇත.

| | 2010/11 රු.මිලියන | 2009/10 රු.මිලියන | වැඩිවීම රු.මිලියන |
|---|---|---|---|
| ප්‍රචාරණය සහා අලෙවි ප්‍රවර්ධනය | 27.9 | 17.4 | 10.5 |
| ජා.ගො.බදු වියදම් | 130.9 | 120.3 | 10.6 |
| නීති හා වෘත්තීමය ගාස්තු | 4.3 | 3.1 | 1.2 |
| විගණන සේවා | 1.8 | .4 | 1.4 |
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | 8.6 | 4.3 | 4.3 |
| කාර්යය මංඩල පිරිවැය | | | |
| වැටුප් වේතන සහා බැදි වියදම් | 550.4 | 473.9 | 76.5 |
| සේ.අ.අ. සහ සේ.භා.අ | 35.4 | 28.3 | 7.1 |
| ප්‍රතිලාභ සැලසුම් පිරිවැය- පාරිතෝශික | 76.6 | 21.6 | 55.0 |

තව දුරටත්, පොල්ගහවෙල පිහිටි ගව ආහාර කම්හල සහ ගාල්ල පිහිටි මීකිරි කම්හලේ ඇති වූ පහත සදහන් අලාභ සමාගමේ ශුද්ධ ලාභයේ අඩු කිරීමට දායක වී ඇත.

| | 2010/11 රු.මිලියන | 2009/10 රු.මිලියන | වැඩිවීම රු.මිලියන |
|---|---|---|---|
| ගව ආහාර කම්හල (අලාභය) | (23.3) | (16.8) | (6.5) |
| මීකිරි කම්හල (අලාභය) | (2.3) | (1.8) | (0.5) |
| ශුද්ධ අලාභය | (25.6) | (18.6) | (7.0) |

සමාගමේ ශුද්ධ ලාභය ශ්‍රී.ලං.ආ.මංඩල ගිවිසුම යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති අතර ශද්ධ ලාභ අඩු කිරිමේ කොටස මූල්‍ය වෙළෙදපලේ සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් තුළින් පාලනය කරනු ලැබ ඇත.

| | 2010/11 රු.මිලියන | 2009/10 රු.මිලියන | පහත වැටීම රු.මිලියන |
|---|---|---|---|
| පොලී ආදායම | 83.6 | 88.4 | (4.8) |
| විනිමය ලාභ (අලාභ) | (15.2) | (4.8) | (10.4) |
| ශුද්ධ ආදායම | 68.4 | 83.6 | (15.2) |

**අවසානය**

අවසාන වශයෙන්, මම මෙම වර්ෂය සාර්ථක කර ගැනීම සදහා අමාත්‍යංශය සහ අධ්‍යක්ෂ මංඩලය විසින් ලබාදුන් සහයෝගය, ධෛර්යමත් කිරිම සහ උපදේශයන් අගය කිරීමට කැමැත්තෙමි. එමෙන්ම සියළුම කළමණාකරුවන්ට සහ ඔවුන්ගේ කාර්යය මංඩලයට මෙම වර්ෂය තුළදී සේවයට කැපවීම වෙනුවෙන් ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මූල්‍ය ප්‍රකාශනයන් සකස්කර ඉදිරිපත් කිරිම වෙනුවෙන් දක්වන ලද කැපවීම වෙනුවෙන් මූල්‍ය අංශයේ කාර්යය මංඩලයට විශේෂ ස්තූතිය පිරිනමන අතර සමාගම් පද්ධතිය සහ ක්‍රියා පිළිවෙල දියුණු කිරිම වෙනුවෙන් දැක්වූ සහයෝගය සදහා අභ්‍යන්තර විගණකවරුන් වන එස්.ජේ.එම්.එස්. ඇසෝසියේට්ස් වෙත සහ අවසන් වශයෙන් ඉතා කෙටි කාල රාමුවක් තුළදී විගණන ගිණුම් ඉදිරිපත් කිරිම වෙනුවෙන් බාහිර විගණකවරුන් වන බී.ඩී.ඕ. පාට්නර්ස් වෙත මාගේ ස්තූතිය පිරි නමමි.

**සී. මඩුගල්ල**
මුදල් පාලක
මිල්කෝ (පුද්ගලික) සමාගම

වාර්ෂික වාර්තාව 2010/2011

**අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව**
මිල්කෝ පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් 2011 මාර්තු 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වන අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කළ මුදල් වාර්තාව සතුටින් ඉදිරිපත් කරමු.

**ප්‍රධාන කාර්යය**
වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ නැවුම් කිරි එකතු කිරීම, සැකසීම, ඇසුරුම් කිරීම, බෙදාහැරීම සහ කිරි නිෂ්පාදන අලෙවි කිරීමයි.

**ව්‍යාපාර කටයුතු සමාලෝචනය**
වාර්තාවේ අත්‍යවශ්‍යම අංගයක් වන සභාපතිගේ, උප සභාපතිගේ, ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ සහ මූල්‍ය පාලකගේ සමාලෝචනයේ 2010.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම් පිළිබඳ විස්තරාත්මක විස්තරයක් ඇතුළත් වේ

**දේපල,පිරියත සහ උපකරණ**
වර්ෂය තුළ දේපල, පිරියත සහ උපකරණවල අමතර එකතුකිරීම් රුපියල් මිලියන 188.1ක් වන අතර ක්ෂයකිරීම් අයකිරීම් පෙන්වා දී ඇති පරිදි වේ.

**අධ්‍යක්ෂ මංඩලය**
පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යංශය පිහිටවීමෙන් පසු මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් පහත අධ්‍යක්ෂ මංඩලය 2010 මැයි 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදි.

සුනිල් චන්ද්‍ර සිල්ලපන වික්‍රමසිංහ මයා - සභාපති
කන්කානමගේ සංජය ලීලාරත්න මයා - නියෝජ්‍ය සභාපති
මොහමඩ් නව්ෂාඩ් ජුනයිදීන් මයා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
රාජු සිවරාමන් මයා - අධ්‍යක්ෂ - M'Sc (Arch) FIA (ශ්‍රී ලංකා)
සෙල්වදොරෙයි ලෝගනාදන් මයා - අධ්‍යක්ෂ - FCMA (UK) FSCMA (ශ්‍රී ලංකා)
අජිත් දිසානායක මයා - අධ්‍යක්ෂ - (Ph'D)
තිලංක වීරසිංහ මයා - අධ්‍යක්ෂ ,නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්, දිව්රුම් කොමසාරිස්
ඒ. සක්තිවේලු මයා - අධ්‍යක්ෂ - පශ්චාත් උපාධි ඩිප්ලෝමා කෘෂිකර්මය,ආර්ථික විද්‍යා (එක්සත් රාජධානිය) B'D. (පශු ) පේරාදෙනිය
රත්නතිලක ලේකම්ගේ මයා - අධ්‍යක්ෂ

නව රේඛීය අමාත්‍යංශය වෙනස්වීමෙන් 2010 මැයි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත අධ්‍යක්ෂ මංඩලය ඉල්ලා අස්විය.

කුමාර් අබේසිංහ මයා - සභාපති
එන්.එම්.කේ.පී.එම්.නවරත්න මයා - නියෝජ්‍ය සභාපති
රූමි ජවුෆර් මයා ක්‍රියාකාරී - අධ්‍යක්ෂ
ඩබ්.ඩී.පී.ෆොන්සේකා මයා - අධ්‍යක්ෂ
ඩී. වෙන්කටේස්වරන් මයා - අධ්‍යක්ෂ
සී.බී. හේරත් මයා - අධ්‍යක්ෂ
එස්.අයි.එම්.එම්. නස්වර් මයා - අධ්‍යක්ෂ
අනෝමා නන්දනී ජයමහ මිය - අධ්‍යක්ෂ

2010 මැයි 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වූ නව අධ්‍යක්ෂ මංඩලයෙන් පහත අධ්‍යක්ෂවරුන් දෙදෙනා 2010 දෙසැම්බර් 21 දින සිට බලපාන පරිදි ඉල්ලා අස්විය

ඒ. සක්තිවේලු මයා - අධ්‍යක්ෂ
රත්නතිලක ලේකම්ගේ මයා - අධ්‍යක්ෂ
පහත පරිදි නව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් අධ්‍යක්ෂ මංඩලයට පත් කරන ලදි
ධණුක දික්වැල්ල මයා 2010.12.21 දින සිට බලපාන පරිදි
ධෂිකා එඩ්වඩ් මිය - උපාධි (ඉංග්‍රීසි) 2011.01.12 දින සිට බලපාන පරිදි

**කොටස් පිළිබඳ තොරතුරු**
සමාලෝචනයට අදාළ වර්ෂය තුළ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය පිළිවෙළින් රුපියල් මිලියන 500ක් සහ රුපියල් මිලියන 319.4 ක් වූහ.

**සංචිත**
රු.1,108,087,428ක්වූ ඉදිරියට ගෙනා සමුච්චිත ලාභය ගිණුම් පිළිබඳ පිටු 3හි බදුවලට පසු රු.83,191,550ක්වූ පවත්නා වර්ෂයේ ලාභයට ගලපන ලදී
රු.25,000,000ක්වූ ප්‍රාග්ධන සංචිත ඇතුළුව සංචිත සහ වර්ෂය අවසනදී රු.1,689,978ක්වූ නිදන් අරමුදල , අරමුදලේ අරමුණු සහ විස්තර ගිණුම්වල 17.1 සහ 18 සටහන්තුළ පෙන්වා දී ඇත.

**ගිවිසුම්වලදී අධ්‍යක්ෂවරුන්ගේ අභිමතය**
ගිණුම්වල 27.23 සටහනින් පෙන්වාදී ඇති සහ ඒ යටතේ සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ කිසිදු ගිවිසුම් කටයුතුවලදී ඍජුව හෝ වක්‍රව සම්බන්ධවී නොමැත.

**සංස්ථා පාලනය**
සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් යහ පාලනය සහතික කරනු ලැබේ. සමාගමේ අරමුණු මෙන්ම කොටස්කරුවන්ගේ බලාපොරොත්තු සමග අනුකූලවන පැවැත්ම සහතික කිරීම අධ්‍යක්ෂ මංඩලයේ වගකීම වේ.

**බදු කරණය**
පොලී ආදායමින් ඇතිවන ආදායම් බදු බැඳියාව ගිණුම්වල සටහන් අංක 23 යටතේ පෙන්වා දේ. මෙහෙයුම් කටයුතුවල ලාභය 2006 දේශීය ආදායම් පනතේ 16 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**
රජයට, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට ගෙවීමට ඇති සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට නිවැරදිව ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරුන්ගේ දැණුම සහ විශ්වාසය අනුව සෑහීමට පත්වේ.

**අනුකූලතාවය**
ශ්‍රී ලංකාවේ හෝ වෙනත් තැනකට අදාළවන නීති සහ රෙගුලාසිවලට පටහැනි වන කිසිදු කාර්යයක නිරත වී නොමැත.

**ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

**අඛණ්ඩ පැවැත්ම**
සමාගමට එහි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙනයාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත්වේ. මෙම අරමුණ මත සිටිමින් සමාගමේ ගිණුම් සකස් කිරීමේදී අප අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය යොදාගනිමු.

**විගණකවරුන් පත්කිරීම**
2011.03.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා සමාගමේ ගිණුම් විගණනය කිරීමට වරලත් ගණකාධිකාරීවරුන් වන MS BDO Partners ආයතනය විගණකාධිපති විසින් නම් කරන ලද අතර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලදී. විගණනවරුන්ගේ විධිමත් පත්වීම කොටස්කරුවන්ගේ වාර්ෂික රැස්වීමේදී සිදු කරන ලදී.

අධ්‍යක්ෂවරුන් දැනුවත් වී ඇති පරිදි, විගණකවරුන් සමාගම සමග හෝ ඔවුන්ගේ නිදහසට බලපෑමක් කළ හැකි එහි උප සමාගම් සමග කිසිදු සම්බන්ධතාවයක් නොමැත.

මංඩලයේ අණ පරිදි

අත්සන් කලේ

**ෆිනෑන්සියල් සර්විසස් හා කොමර්ෂල් ඒජන්සීස් (පුද්ගලික)සමාගම.,**
(වග./555/91)
අංක 28, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07.

සමාලෝචන වර්ෂය තුලදී මාසයකට එක් වරක් යන පදනම මත අධ්‍යක්ෂ මංඩලය විසින් අධ්‍යක්ෂ මංඩල රැස්වීම් නිතිපතා පවත්වන ලදී. මුදල් පාලනය පවත්වාගෙන යාමේදී සහ එය තහවුරු කිරීමේදී ආයතනික සැලසුම් සහ වාර්ෂික අයවැය ප්‍රමුඛතම අංගයන් වූ අතර මේවා මුදල් වර්ෂය ආරම්භයේදී සියළුම රේඛීය කළමණාකරුවන්ගේ උපදේශයෙන් සහ මංඩලයේ අනුමැතියෙන් සකස් කරන ලදී.

මාසික කාර්යය සාධන වාර්තාව පසුගිය මාසය හා සැසැඳීමක් සිදුකර අයවැය අදාළ මාසික රැස්වීමේදී විධිමත්ව සම්මත කරනු ලැබ ඇත. මෙම වාර්තාව මුදල් සහ ඉලක්ක සපුරා ගැනීමේ මෙහෙයුම් කාර්යය සාධනයට කාලීන තොරතුරු සම්පාදනය කරන අතර අධ්‍යක්ෂ මංඩලයට සමාගමේ ලාභ සහ අලාභ සම්බන්ධයෙන් ඵලදායී කළමනාකරණ තීරණයන් ගැනීමට ඉවහල් වේ.

**විගණන කමිටුව**

මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂවරයෙක් විසින් විගණන කමිටුවේ සභාපති විය යුතුය. මිල්කෝ (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මංඩලය මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු නොලබන බැවින් කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් ක්‍රියාත්මක වන අතර කමිටුවේ සභාපති වශයෙන් ඉන් එක් අයෙක් කටයුතු කරනු ලැබේ. මෙම කමිටුව මංඩලයේ උප කමිටු ලෙස මෙහෙයවනු ලබන අතර ස්වාධීන හැගීමෙන් කටයුතු කරන අභ්‍යන්තර විගණන අංශයකින් සේවය කරනු ලබයි.

වර්ෂය තුළ එස්ජේඑම්එස් ඇසෝසියේට්ස් අභ්‍යන්තර විගණකවරුන් වශයෙන් කටයුතු කරන ලදී. එයට ප්‍රධාන කාර්යාලයට අමතරව කොළඹ, අඹේවෙල, දිගන කම්හල්වල නේවාසික නිලධාරීන් සහිතව කටයුතු කරනු ලබන ශාඛා කාර්යාල ඇත.

අභ්‍යන්තර විගණකවරුන් විසින් සකස්කරනු ලබන විගණන සැළසුම් වර්ෂය ආරම්භයේදීම විගණන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර මෙම සැලසුම අනුව යමින් වර්ෂය මුළුල්ලේම අභ්‍යන්තර විගණන පරීක්ෂා කිරීම් කරනු ලැබේ. විගණන වාර්තාවන්ගෙන් හෙලිදරව්වන කරුණු සම්බන්ධව ඔහුන්ගේ අදහස් සහ ප්‍රතිචාර දැනගැනීම සඳහා පළමුවෙන්ම අදාළ කළමනාකරුවන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග සාකච්ඡා කරනු ලැබේ. එම අදහස් මත පදනම්ව සාරාංශ වාර්තාවක් සකස් කරනු ලබන අතර විමර්ශනය සහ කළයුතු කාර්යයන් සඳහා එය විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. මෙම කමිටුව මාසයකට එක් වරක් රැස්වේ.

**ආයතනික කළමණාකරණය**

සමාගම කොටස් හිමියන්ට සමාගමේ මූල්‍යමය තත්ත්වය සාධාරණ සහ නිවැරදිව නියෝජනය වන පරිදි නියමිත ගිණුම් වාර්තාවන් පවත්වාගෙන යන බවට අධ්‍යක්ෂ මංඩලය සහතික කරනු ලබයි. එමෙන්ම ඔවුන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ සමාගම් පනතේ අවශ්‍යතාවයන් අනුව මූල්‍යමය ප්‍රකාශයන් පිළියෙල කරනු ලබන බවටද සහතික වේ.

විගණන කමිටුව සාමාන්‍යයෙන් විධායක නොවන අධ්‍යක්‍ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඉන් එක් අයෙක් මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන සාමාජිකයෙක් වීම අනිවාර්ය වේ. මෙම සාමාජිකයා කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කරනු ලබයි. වර්තමානයෙහි මිල්කෝ (පුද්ගලික) සමාගමේ අධ්‍යක්‍ෂ මංඩලය මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු නොලබන බැවින් කමිටුව අධ්‍යක්‍ෂවරුන් දෙදෙනෙකුගෙන් ක්‍රියාත්මක වන අතර කමිටුවේ සභාපති වශයෙන් පහත අත්සන් කරන අය කටයුතු කරනු ලැබේ.

සමාලෝචන කාලය තුලදී විධිමත් රැස්වීම් පවත්වන ලදී. මුදල් පාලක, සහකාර කළමණාකරුවන් (මුදල්) දෙදෙනෙක් සහ අභ්‍යන්තර විගණන කළමණාකරු ආරාධනාවන් මගින් සියළුම රැස්වීම්වලට සහභාගි විය. බාහිර විගණක නිලධාරීන් එක් රැස්වීමකට සහභාගි විය. කම්හල්වල ප්‍රධානීන්ට සහ සමාගමේ අංශ ප්‍රධානීන්ට රැස්වීම්වලට සහභාගිවීමට ආරාධනා කරන ලදී.

වර්ෂය තුළ පැවති රැස්වීම්වලදී කමිටුව අභ්‍යන්තර විගණන විමසුම් සහ මාසික විගණන වාර්තා සමාලෝචනය කරමින් කම්හල් ප්‍රධානීන් විසින් සහ අනෙකුත් ක්‍රියාකාරි ප්‍රධානීන් විසින් අභ්‍යන්තර විගණන වාර්තාවන්ගෙන් පෙන්වා දී ඇති කාරණා සම්බන්ධයෙන් දෙන ලද විස්තර කිරීම් සහ පැහැදිලි කිරීම් පරීක්ෂා කරන අතර  අභ්‍යන්තර විගණන වාර්තාවන්ගෙන් පෙන්වා දී ඇති අඩුපාඩු සහ දෝෂ නිවැරදි කර ගැනීමට සහ නැවත එම දෝෂ අනාගතයේදී සිදු නොකිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. එමෙන්ම කමිටුව අභ්‍යන්තර විගණන විමසුම් සඳහා ඉක්මන් පිළිතුරු යැවීම සඳහා ඒවාට අදාළ කාර්යය මංඩලයටද උපදෙස් ලබාදේ.

කමිටුව විසින් අභ්‍යන්තර විගණන  වාර්තාවන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන නිලධාරීන් සමග සාකච්ඡා කරමින් සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය නිර්දේශ සිදු කරයි.

මෙම කමිටුව බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන කළමණාකරණ වාර්තා සමාලෝචනය කරමින් සභාපතතුමාට, නියෝජ්‍ය සභාපතිතුමාට, සහ ක්‍රියාකාරී අධ්‍යක්‍ෂකට කළමණාකරණ වාර්තාවේ විස්තරාත්මකව සඳහන් සියළු අංගයන් පරීක්‍ෂා කර සමාගමේ කාර්යයන් දියුණු කිරීම සඳහා මෙම කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය සුදුසු පියවර ගැනීමටත් උපදෙස් ලබා දී ඇත.

**එස්. ලෝගනාදන්**
වැඩ බලන සභාපති - විගණන කමිටුව
මිල්කෝ (පුද්ගලික) සමාගම

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ සාමාජිකයින් වෙත

**1. මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව**

අප විසින් 2011 මාර්තු 31 වන දිනට ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය සහ පිටු අංක 05 සිට 26 දක්වා, දක්වා ඇති වෙනත් පැහැදිලි කිරීමේ සටහන් වලින් යුක්ත වූ සීමාසහිත මිල්කෝ පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ විගණනයක් කරන ලදී. 2010 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් වෙනත් විගණකවරුන් විසින් විගණනය කළ අතර 2011 පෙබරවාරි 14 දිනැති ඔවුන්ගේ වාර්තාවෙන් සමාගම සඳහා පහත කරුණු සම්බන්ධයෙන් තත්වාගනනය නොකල මතයන් ඉදිරිපත් කරන ලදී.

1) බර තැබූ පිරිවැයහි සාමාන්‍ය ගණනයේදී සිදුවූ වරදක් හේතුවෙන් දේපළ, පිරියත සහ උපකරණවල අන්තර්ගත පිරිවැය රුපියල් මිලියන 7.5 ක් වැඩියෙන් දක්වා තිබේ.
11) ලෙජරයට අනුව ආපදා ණය ශේෂය වැටුප් සැකසීමේ පද්ධතියේ ශේෂයෙන් රුපියල් මිලියන 12.5 ක වෙනසක් හඳුනා ගැණිනි.
111) බෝතල් සහ බහලුම් ලබාගැනීමේ හැකියාවට අදාළවන රුපියල් මිලියන 31.4 ක්වටිනා රඳවා ගත් තැන්පතු හඳුනා ගැනීමට නොහැකි වී ඇත.

**2. මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ කළමනාකරණයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීමකි. මෙම වගකීමට වැරදි සහ වංචා හේතුවෙන් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීමේදී සහ අදාළ කර ගැනීමේදී සහ අවස්ථානුකූලව සාධාරණයැයි සිතන ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමේදී විය හැකි සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා අදාල වන අභ්‍යන්තර පාලනයන් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ එය මනා ලෙස පවත්වාගෙන යාම අන්තර්ගත වේ.

**3. විගණනයේ විෂය පථය සහ මතයේ පදනම**

අපගේ වගකීම වන්නේ අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීමයි. පරිච්ඡේද 4.1හි සාකච්ඡා කල පරිදි හැර අප විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපගේ විගණනනය පවත්වන ලදී. එම ප්‍රමිතීන් අවශ්‍ය වන්නේ මූල්‍ය ප්‍රකාශනයන් සැලකිය යුතු වැරදි ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ විනිශ්චයක් ලබා ගැනීම සඳහා අපගේ විගණනය සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමටයි.

විගණනයක් මගින් මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් ඉදිරිපත් කරන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි අත්හදා බැලීමේ මට්ටමින් පරීක්ෂණයට ලක් කිරීම අන්තර්ගත වේ. එලෙසම විගණනයක දී භාවිතයට ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ කළමනාකරණය විසින් ගනු ලැබූ වැදගත් තක්සේරුන්, එමෙන්ම සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශනයන්ගේ ඉදිරිපත් කිරීම ඇගයීමකට ලක් කිරීමද අන්තර්ගත වේ.

අප විසින 4.1 පරිච්ඡේදයේහි දක්වා ඇති කරුණු හැර, අපගේ විගණනයේ පරමාර්ථ සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අපගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව ලබා ගතිමු. එම නිසා අපගේ සුදුසු මතයන් ලබාදීම සඳහා සාධාරණ පදනමක් විගණනයෙන් සපයා ඇති බව අප විශ්වාස කරමු.

**4. මතය**

4.1 2011 මාර්තු 31 වන දිනට රුපියල් 347,851,960/= ක් වටිනාකමින් යුත් භෞතික තොගය ගණනය කිරීම පරීක්ෂා කරනු නොලැබූ අතර එසේ වූයේ එම දිනය අප විසින් සමාගමේ විගණන කටයුතු ආරම්භ කරන ලද දිනයට පෙර දිනයක් වීම නිසාය. සමාගමේ තොගයන්හි පසුගිය සැසැදීම් වාර්තාවන්ගේ ස්වභාවය අනුව වෙනත් විගණන ක්‍රියාපරිපාටීන් විසින් තොග ප්‍රමාණයන් පිළිබඳව අපට සෑහීමට පත්වීමට නොහැකි විය.

4.2 අපගේ පරීක්ෂාකිරීමෙන් පෙන්නුම් වන පරිදි අපගේ මතය අනුව එවැනි ගැලපීම්වල බලපෑම්වලින් තොරව අවශ්‍යතාවය මත තීරණය කර තිබුනේනම් ඉහත පරිච්ඡේද 4.1හි සඳහන් කාරණාවන් පිළිබඳවත්, සමාගම 2011 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විධිමත් ගිණුම්කරණ වාර්තාවන් පවත්වාගෙන ඇතිබවටත්, ගිණුම් කරණ ප්‍රකාශනයන් තුළින් 2011 මාර්තු 31 දිනට සමාගම පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බවටත් සහ එහි ලාභ සහ මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවන බවටත් අපට සෑහීමට පත්විය හැකිව තිබුණි.

**5. අනෙකුත් නෛතික හා රෙගුලාසි අවශ්‍යතාවයන් සඳහා වාර්තාව**

2007 අංක 7 දරණ සමාගම් පනතේ 151 (2) ඡේදයේ නියමයන්ට මෙම මූල්‍ය ප්‍රකාශනයන් අනුකූල වේ.

BDO Partners

**වරලත් ගණකාධිකාරීන්**
කොළඹ
2011 නොවැම්බර් 24 දින

# 2011 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | සටහන | 2010/2011 රු. | 2009/2010 රු. |
|---|---|---|---|
| ආදායම | 3 | 4,548,974,053 | 4,093,051,886 |
| විකුණුම් පිරිවැය | | (4,012,024,624) | (3,395,561,341) |
| **දළ ලාභය** | | 536,949,429 | 697,490,545 |
| අනෙකුත් ආදායම් | 4 | 100,440,617 | 102,164,980 |
| | | 637,390,046 | 799,655,525 |
| පරිපාලන වියදම් | | (413,113,697) | (332,794,334) |
| බෙදාහැරීමේ වියදම් | | (66,130,740) | (100,074,952) |
| අනෙකුත් වියදම් | | (31,977,865) | (22,290,469) |
| මූල්‍ය පිරිවැය | 5 | (15,504,264) | (5,771,044) |
| | | (526,726,566) | (460,930,799) |
| බද්දට පෙර ලාභය | 6 | 110,663,480 | 338,724,726 |
| ආදායම් බදු වියදම් | 7 | (27,471,930) | (37,975,136) |
| **වර්ෂය සඳහා වන ලාභය** | | 83,191,550 | 300,749,590 |
| කොටසක මූලික ඉපැයුම | 8 | 3 | 9 |
| කොටසක ලාභය | | | |
| - අවසන් | 9 | - | 0.92 |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ

22 පිටුවේ සිට 43 පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකූල කොටසක් වේ.

**2011 නොවැම්බර් 24 දින**
**කොළඹ**

# 2011 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය

| | සටහන් | 2011.03.31 දිනට රු | 2010.03.31 දිනට නැවත සදහන් කළ රු |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල,පිරියත සහ උපකරණ | 10 | 532,747,937 | 503,286,649 |
| ප්‍රාග්ධන වැඩ | | 19,366,961 | 68,787,758 |
| | | 552,114,898 | 572,074,407 |
| **ජංගම වත්කම්** | | | |
| පශු සම්පත් | 11 | 1,431,645 | 444,255 |
| තොගය | 12 | 347,851,960 | 527,206,176 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් | 13 | 895,480,728 | 777,229,208 |
| කෙටි කාලීන ආයෝජන | 14 | 930,623,649 | 722,597,533 |
| මුදල් හා ඒ සමාන දේවල් | 15 | 394,346,782 | 368,024,946 |
| | | 2,569,734,764 | 2,395,502,118 |
| ***මුළු වත්කම්*** | | 3,121,849,662 | 2,967,576,525 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| ප්‍රාග්ධනය සහ සංචිත | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 16 | 319,454,060 | 319,454,060 |
| ප්‍රාග්ධන සංචිත | 17 | 25,000,000 | 25,000,000 |
| ප්‍රති ඇගැයුම් සංචිත | | 336,454,462 | 336,454,462 |
| නිදන් අරමුදල | 18 | 1,689,978 | 1,689,978 |
| රඳවාගත් සංචිත | | 1,191,278,978 | 1,108,087,428 |
| කොටස් කරුවන්ගේ අරමුදල | | 1,873,877,478 | 1,790,685,928 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පොලී රහිත ණය සහ ණයට ගැණුම් | 19 | 85,698,717 | 85,698,717 |
| පොලී සහිත ණය | 19 | - | 423,240 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් - පාරිතෝශික | 20 | 201,703,631 | 125,097,698 |
| විලම්බිත ආදායම -රජයෙන් ලබාදෙන | 21 | 20,757,825 | 22,567,086 |
| | | 308,160,173 | 233,786,741 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ | 22 | 823,121,208 | 809,375,797 |
| ආදායම් බදු වගකීම | 23 | 27,758,202 | 42,819,482 |
| කෙටි කාලීන ණය | 19 | 423,240 | 4,677,604 |
| බැංකු අයිරා | 24 | 88,509,361 | 86,230,973 |
| | | 939,812,011 | 943,103,856 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 3,121,849,662 | 2,967,576,525 |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ

බැදීම් සහ අසම්භාව්‍යයන් 25 සහ 26

22 පිටුවේ සිට 43 පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකූල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

ප්‍රධාන මූල්‍ය නිලධාරි

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම සහ ඉදිරිපත් කිරිම අධ්‍යක්ෂ මංඩලයේ වගකීම වේ.

මෙම මූල්‍ය ප්‍රාකාශන 2011 නොවැම්බර් 24 දින මංඩලය විසින් අනුමත කර ඇත.

(අධ්‍යක්ෂ) (අධ්‍යක්ෂ)

2011 නොවැම්බර් 24 දින
කොළඹ

# 2011 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සදහා හිමිකම් වෙනස්වීම පිළිබද ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධන රු. | ප්‍රාග්ධන සංචිත රු. | ප්‍රති ඇගැයුම් සංචිත රු. | නිදන් අරමුදල රු. | රදවාගත් ඉපැයුම් රු. නැවත සදහන් කළ. | මුළු එකතුව රු. නැවත සදහන් කළ |
|---|---|---|---|---|---|---|
| 2009.03.31 දිනට ශේෂය | 306,500,020 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 836,699,281 | 1,506,343,741 |
| වර්ෂය සදහා ශුද්ධ ලාභය (30.3 සටහ | - | - | - | - | 300,749,590 | 300,749,590 |
| කොටස් නිකුතුව (30.3 සටහන) | 12,954,040 | - | - | - | - | 12,954,040 |
| ඒකාබද්ධ අරමුදලට මාරුකලා - ලාභාංශ (30.3 සටහන්) | - | - | - | - | (29,361,443) | (29,361,443) |
| 2010.03.31 දිනට ශේෂය | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 1,108,087,428 | 1,790,685,928 |
| වර්ෂය සදහා වන ලාභය | - | - | - | - | 83,191,550 | 83,191,551 |
| 2011.03.31 දිනට ශේෂය | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 1,191,278,978 | 1,873,877,478 |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ

22 පිටුවේ සිට 43 පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සදහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකූල කොටසක් වේ.

**කොළඹ**
**2011 නොවැම්බර් 24 දින**

# මිල්කෝ (පුද්ගලික) සමාගම
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2011.03.31 දිනට රු. | 2010.03.31 දිනට - රු. |
|---|---|---|---|
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම්තුළින් ලද මුදල් ප්‍රවාහය*** | | | |
| බද්දට පෙර ශුද්ධ ලාභය | | 110,663,480 | 338,724,726 |
| ගැලපුම්, | | | |
| - දේපල,පිරියත හා උපකරණ මත ක්ෂය කිරීම් | | 158,638,553 | 208,191,757 |
| - ආයෝජන ආදායම් | | (88,453,539) | (88,453,539) |
| - දේපල,පිරියත හා උපකරණ ඉවත් කිරීම මත ලාභ /අලාභ | | - | (2,090,432) |
| - පොලී වියදම් | | 964,195 | 964,195 |
| - විලම්බිත දීමනා මත හඳුනාගත් ආදායම | | (9,669,546) | (583,453) |
| - තොග කපා හැරීම | | 260,681 | 25,778 |
| - වුවමාරු අලාභ | | 15,171,011 | - |
| - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වෙන් කිරීම පාරිතෝශික | | 85,457,151 | 31,794,745 |
| | | 162,368,505 | 149,849,051 |
| ***කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය*** | | 273,031,985 | 488,573,777 |
| තොග - (වැඩිවීම) / අඩුවීම | | 179,093,535 | (186,870,732) |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම්වල (වැඩිවීම) / අඩුවීම | | (108,902,258) | (123,801,500) |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම) | | 13,745,411 | (4,567,806) |
| | | 83,936,688 | (315,240,038) |
| ***මෙහෙයුම්තුළින් උත්පාදනය කළ මුදල්*** | | 356,968,674 | 173,333,739 |
| ගෙවූ පොලී | | - | (964,195) |
| ගෙවූ ආදායම් බදු | | (42,533,303) | (24,909,378) |
| ගෙවූ ප්‍රතිලාභ සැලසුම් පාරිතෝශික | | (8,851,220) | (10,241,352) |
| | | (51,384,523) | (36,114,925) |
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබුණු/භාවිතා වූ ශුද්ධ මුදල් ප්‍රමාණය*** | | 305,584,151 | 137,218,814 |
| ***ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද මූල්‍ය ප්‍රවාහය*** | | | |
| දේපල,පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (112,835,181) | (172,971,880) |
| ඉදිකිරීම හේතුකොට ගෙන දේපල,පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (26,831,253) | - |
| ගෙවූ ලාභාංශ | | - | (29,361,442) |
| ලද පොලී | | 85,078,392 | 81,432,195 |
| කෙටි කාලීන ආයෝජන | | (223,197,127) | (8,063,846) |
| දේපල,පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල | | - | 2,394,598 |
| ***ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතාකළ ශුද්ධ මුදල්*** | | (277,785,169) | (126,570,375) |
| ***මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මූල්‍ය ප්‍රවාහය*** | | | |
| රජයෙන් ලද දීමනා | | 7,860,285 | 1,197,156 |
| කෙටිකාලීන ණය සහ ණයට ගැණුම්වලින් ලැබීම් | | (5,144,988) | (11,675,637) |
| අධ්‍යක්ෂවරුන්ගෙන් සහ කොටස්හිමියන්ගෙන් ලැබීම් | | | (4,055,619) |
| ***මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල*** | | 2,715,297 | (14,534,100) |
| මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම | | 30,514,279 | (3,885,661) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දේ | 24 සටහන | 281,793,973 | 285,679,634 |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදලට සමාන දේ | 24 සටහන | 305,837,421 | 281,793,973 |

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් වේ

22 පිටුවේ සිට 43 පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකූල කොටසක් වේ.

2011 නොවැම්බර් 24 දින
කොළඹ

1. ආයතනික තොරතුරු

1.1.1. පොදු

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම ("සමාගම") යනු ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන සංස්ථාගත කර ඇති සීමාසහිත වගකීම දරණ සමාගමකි.

"සීමාසහිත ලංකා කිරියා කිරි කර්මාන්ත (පුද්.) සමාගම" ලෙස 1996 මැයි 09 වන දින සමාගම සංස්ථාගත කර ඇත. සමාගමේ නම සීමාසහිත මිල්කෝ (පුද්) සමාගම ලෙස 2001 ජූලි 23 වන දින සිට වෙනස් කර ඇත. ශ්‍රී ලංකා රජය (GOSL) හා ඉන්දියානු ජාතික කිරි සංවර්ධන මණ්ඩලය (NDDB) අතර ඇති කර ගත් ගිවිසුම ප්‍රකාරව, සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගමට අයත් එය 1998 පෙබරවාරි 03 වන දින වන විට භාවිතා කරනු ලබන සියලු දේපල, පිරියත හා උපකරණ (ඉඩම හැර) සහ සීමා. ලංකා කිරි නිෂ්පාදන සමාගම විසින් එම දිනය වන විට භාවිතා කරන ඉඩම් හා ගොඩනැගිලිවල බදු අයිතිය 1998 පෙබරවාරි 04 වන දින සිට සමාගම වෙත මාරු කර තිබේ. එසේ මාරු කරන ලද ශුද්ධ වත්කම්වල වටිනාකම රු. 306, 500,020/- කි. තවද, 2000 අගෝස්තු 08 දිනැති ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණ කොමිසමෙහි ලිපියට අනුව බදුගත් ඉඩම හා ගොඩනැගිලි වල වාර්ෂික කල්බදු කුලිය වන රු. 20, 427,900/- මුදල ඒකාබද්ධ ව්‍යාපාර බවට පත් කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කපා හැර ඇත. ඒකාබද්ධ ගිවිසුම වැඩි කලක් බලාත්මක නොවුවද එකී රජයේ ඉඩම හා ගොඩනැගිලි වලට අදාළව ගිණුම් යථා පරිදි ගැලපීම් සිදු කිරීමට සමාගම පියවර ගෙන නැත.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය නො 45, නාවල පාර, කොළඹ 05 යන ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික කටයුතු ද එම ස්ථානයේ සිදු කරනු ලබයි. සමාගමේ ප්‍රධාන කර්මාන්තශාලා නාරාහේන්පිට, අඹේවෙල, දිගන හා පොළොන්නරුව යන ස්ථානවල පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ආකාරය

වර්ෂය තුලදී සමාගම විසින් සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ කිරි එකතු කිරීම, සැකසීම, ඇසිරීම, බෙදාහැරීම හා එම නිෂ්පාදන අලෙවි කිරීමයි.

1.3 මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා බලය දුන් දිනය

2011 මාර්තු 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2011 නොවැම්බර් 24 දින අධ්‍යක්ෂ මංඩලයේ යෝජනාව අනුව බලය ලබාදෙන ලදී.

2. ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 සැකසීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ප්‍රමිතින් හා පොදුවේ පිලිගත් ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්ප්‍රධායන් යටතේ උපචිත පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මුදල්වලින් ඉදිරිපත්කර ඇත.

2.1.2 සංසන්දනාත්මක තොරතුරු

2007 වර්ෂයේ අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන් හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි 2011 මාර්තු 31 වන දින වන විට හා වසර අවසානය වන විට සමාගමේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, සමකොටස් හා මූල්‍ය ප්‍රවාහ වෙනස්වීම් සමග ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් ("මූල්‍ය ප්‍රකාශන") සකස් කරනු ලැබ ඇත.

2.1.3 අඛණ්ඩභාවය

සමාගම අඛණ්ඩතාවයකින් පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදුකළ අතර ඔවුන් සමාගම ඈවරකිරීමට හෝ වෙළෙදාම් නැවැත්වීමට අදහස් කරනු නොලැබේ.

2.1.4 තුළනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති ස්ථිර වශයෙන්ම යොදා ගනු ලැබ ඇති අතර ගිය වර්ෂය සමගද අනුකූල වේ. පසුගිය වර්ෂයේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ සටහන් අංක 30 සඳහන් පරිදි මෙම වර්ෂයේ ඉදිරිපත්කිරීම සහතික කිරීමට අවශ්‍යවන අවස්ථාවන්හිදී නැවත සකස් කරනු ලැබ ඇත.

2.1.5 අත්හල මෙහෙයුම්

අත්හැර දමන ලද මෙහෙයුම් කර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාමාර්ගයක් හෝ මෙහෙයුම්වල භූගෝලීය ප්‍රදේශයක් නියෝජනය කරනු ලබන තනි සැලසුමක් අනුව සිදුවන අතහැර දමන ලද හෝ අවසන් කරන ලද සමාගමේ ව්‍යාපාරයන්හි පැහැදිලිව හඳුනාගත හැකි අංගයකි.

ශේෂ පත්‍ර දිනට සමාගමට අත්හැර දමන ලද මෙහෙයුම් කිසිවක් නොමැත.

2.1.6 විදේශ ව්‍යාවහාර මුදල් ගණුදෙනු

සියළුම විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ගනුදෙනුව සිදුකරනු ලබන අවස්ථාවේදී පවත්නා හුවමාරු අනුපාතය අනුව භාවිතා කරන මුදල වන ශ්‍රී ලංකා රුපියලට මාරු කරනු ලැබේ.

විදේශ ව්‍යාවහාර මුදලේ නම්කරන ලද මූල්‍ය වත්කම් සහ බැරකම් එම වර්ෂයට අදාළව සහ පවතින වුවමාරු අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියලට මාරු කරනු ලබන අතර ඉන් ඇතිවෙන ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයන්ට එකතු කරනු ලැබේ.

මුදල් නොවන වත්කම් සහ බැරකම් වටිනාකම් තීරණය කරනු ලැබූවිට පැවතී වුවමාරු අනුපාතය භාවිතා කරමින් පරිවර්තනය සිදු කෙරේ. ලාභ හෝ අලාභ ප්‍රතිඵලය ආදායම් ප්‍රකාශය තුළ ගණනය කරනු ලැබේ.

**2.1.7 අමුද්‍රව්‍ය සහ සංචිත**

සමාන අයිතමයන්යේ සෑම අමුද්‍රව්‍ය වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශනයන්ගේ වෙන් වෙන්ව දක්වන ලදී. සමාන නොවන වර්ගයේ අයිතමයන් හෝ කාර්යයන් ඒවා නොවැදගත් වන්නේනම් මිස වෙන් වෙන්ව දක්වන ලදී.

2.1.8 සුවිශේෂිත ගිණුම්කරණ තක්සේරු කිරීම් සහ උපකල්පනයන්

**අ) තීරණ**

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේදී කළමණාකරණය විසින් මූල්‍ය ප්‍රකාශනයන් තුළින් හදුනාගත් ප්‍රමාණයන් මත ඉතා සුවිශේෂී බලපෑමක් ඇති තක්සේරු කිරීම් හැරුණු විට පහත තීරණයන් සිදුකර ඇත.

**ආ) තක්සේරු කිරීම් සහ උපකල්පනයන්**

